**සවුදි අරමුදලින් මාර්ග ජාල වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය - 2021**
------------------------------------------------------------------------
සවුදි අරමුදලින් මාර්ග ජාල වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා කාලය**
------------------------------------------------------------------------
ව්‍යාපෘතියේ ණය ගිවිසුම් අනුව, එවකට වරාය හා මහාමාර්ග අමාත්‍යාංශය වර්තමානයේ ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර, මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. මධ්‍යම, නැගෙනහිර, සබරගමුව, බස්නාහිර සහ වයඹ පළාත්වල මාර්ග කොටස් 06 ක කි.මී. 131.50 ක් ප්‍රතිසංස්කරණය හා වැඩිදියුණු කිරීම ව්‍යාපෘතියේ අරමුණ වේ. ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු. මිලියන 10,628 කට සමාන එ.ජ.ඩො. මිලියන 81.75 ක් වූ අතර ඉන් රු. මිලියන 7,800 කට සමාන එ.ජ.ඩො. මිලියන 60 ක් මූල්‍යයනය කිරීමට සංවර්ධනය සඳහා වූ සවුදි අරමුදල විසින් එකඟ වී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2013 ජුනි 03 දින ආරම්භ කර තිබුණු අතර 2020 අගෝස්තු 05 දින වන විට නිම කිරීමට නියමිතව තිබුණි. කෙසේ වෙතත්, ව්‍යාපෘතියේ කටයුතු අවසන් කිරීමේ දිනය 2022 අප්‍රේල් 09 දක්වා දීර්ඝ කර තිබුණි.

**1.3 තත්ත්වාගණනය කළ මතය**
--------------------------------
මෙම වාර්තාවේ 2.1 වගුවේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**
------------------------------------------------
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම**
------------------------------------------------------------------------------------------
මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

**1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම**
--------------------------------------------------------
සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් අනාවරණය කරගන්නා බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනිව හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වංචාවක් ඇතිවීමට හේතුවන බැවිනි.

- ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරිම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුලදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ඊට සම්බන්ධ පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. මූල්‍ය ප්‍රකාශන පිළිබද අදහස් දැක්වීම්

### 2.1 ගිණුම්කරණ අඩුපාඩු

| අංකය | ගිණුම්කරණ අඩුපාඩු | වටිනාකම රු. මිලියන | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2021 ජනවාරි 30 වන දින නාඋල නගරය ඇතුළු මහනුවර - යාපනය මාර්ග කොටසේ පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම අවසන් කර තිබුණද, 2021 දෙසැම්බර් 31 වන දින වන විට එය කෙරීගෙනයන වැඩවලින් නිම කරන ලද වැඩවලට මාරු කර නොතිබුණි. | 566.03 | 2022 වර්ෂයේදී ව්‍යාපෘතියේ කෙරීගෙනයන වැඩ ශේෂය සිවිල් වැඩවලට මාරු කිරීමට කටයුතු කරනු ඇත. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 01ට අනුකූලව මාර්ග පිරිවැය ප්‍රාග්ධනිත කළ යුතුය. |
| (ආ) | මූල්‍ය ප්‍රකාශන සහ මහා භාණ්ඩාගාරය විසින් පවත්වාගෙන යනු ලබන වාර්තා වලට අනුව, සමාලෝචිත වර්ෂය තුළදී ණය මුදලින් රු. මිලියන 480ක් මුළු වියදම දරා ඇත. කෙසේ වෙතත්, විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ වාර්තාවල අදාළ මුදල රු. මිලියන 201 ක් ලෙස දක්වා තිබුණි. ඊට අමතරව, ණය යටතේ සටහන් කිරීම වෙනුවට රු.මිලියන 83 ක මුදලක් ලබාදිය හැකි විදේශ ආධාර ලෙස 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල පෙන්වා තිබුණි. එබැවින්, 2021 දෙසැම්බර් 31 | 279 | 2022 සිට රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ වාර්තාව සහ විදේශ සම්පත් දෙපාර්තමේන්තු වාර්තාව සංසන්දනය කිරීමට සටහන් කර ඇත. | අදාළ පාර්ශව සමඟ සාකච්ඡා කර වෙනස්කම් සංසන්දනය කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | දිනට ණය මුදල් උපයෝජනය මූල්‍ය ප්‍රකාශනවල නිසි ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | | |
| (ඇ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 08 ට අනුව, 2021 දෙසැම්බර් 31 දිනට ඉඩම් අත්පත් කර ගැනීම වෙනුවෙන් ප්‍රතිපාදන වෙන්කිරීම සඳහා ඉඩම් කට්ටි 1,280 ක් සඳහා ප්‍රමාද පොලිය සහ ඉඩම් කට්ටි 1,124 ක් සඳහා වන්දි ගෙවීම හඳුනාගෙන නොතිබුණි. | - | එකඟවේ. 2022 වර්ෂයේදී පොලී ගෙවීම් සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන වෙන් කිරීමට කටයුතු කරනු ලැබේ. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 08 අනුව ප්‍රතිපාදන සැළසිය යුතුය. |

**3. භෞතික කාර්ය සාධනය**

**3.1 ව්‍යාපෘති ක්‍රියාකාරකම්වල භෞතික ප්‍රගතිය**

| අංකය | සංරචකය | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | මාර්ග ප්‍රතිසංස්කරණය සහ වැඩිදියුණු කිරීම | පවරා ගැනීමේ සහතිකයට අනුව නාඋල නගරය ඇතුළුව මහනුවර - යාපනය මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීමේ සහ වැඩිදියුණු කිරීමේ ඉදිකිරීම් කටයුතු 2020 දෙසැම්බර් 04 දින අවසන් කර තිබුණි. කෙසේ වෙතත්, 2021 දෙසැම්බර් 31 වන දින දක්වා කිසිදු ඉඩම් කට්ටියකට ඉඩම් අත්පත් කර ගැනීම වෙනුවෙන් වන්දි ගෙවා නොතිබුණි. | එකඟවේ. | ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය කඩිනම් කිරීමට කටයුතු කළ යුතුයි. |
| (ආ) | පාලම් ප්‍රතිසංස්කරණය සහ වැඩිදියුණු කිරීම | (i) ඔරුගොඩවත්ත- අඹතලේ මාර්ගයේ පාලම් අංක 6/2 පුළුල් කිරීමේ කටයුතු 2020 ජනවාරි 13 දින ආරම්භ කර 2021 මාර්තු 13 දින නිම කිරීමට නියමිතව තිබුණි. කෙසේ වෙතත්, 2021 දෙසැම්බර් 31 දිනට සියයට 53 ක භෞතික ප්‍රගතියක් පමණක් ලබාගෙන තිබුණි. මුල් නිම කිරීමේ දිනය අවසන් වී තිබුණද, කොන්ත්‍රාත්කරු විසින් කාලය දීර්ඝ කරන ලෙස ඉල්ලා නොතිබූ අතර, කොන්ත්‍රාත්තුවේ සාමාන්‍ය කොන්දේසිය අනුව ප්‍රමාද හානි වෙනුවෙන් අය කිරීමට ව්‍යාපෘතිය විසින් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | එකඟවේ. | ඉතිරි ප්‍රතිසංස්කරණ කටයුතු කඩිනම් කිරීමට සහ පිරිවැය අවම කිරීම සඳහා කොන්ත්‍රාත්තුවේ කොන්දේසි පිළිපැදීමට කටයුතු කළ යුතුය. |
| | | (ii) ඔරුගොඩවත්ත - අඹතලේ මාර්ගයේ පාලම් අංක 6/1 පුළුල් කිරීමේ කටයුතු 2019 සැප්තැම්බර් | එකඟවේ. ජල සම්පාදන මණ්ඩලයට අදාළ | මාර්ග/පාලම් ප්‍රතිසංස්කරණ කටයුතු ආරම්භ |

| | | | |
|---|---|---|---|
| | 07 දින ආරම්භ කර 2020 දෙසැම්බර් 07 දින නිම කිරීමට නියමිතව තිබුණි. පවරා ගැනීමේ සහතිකයට අනුව පාලම 2021 දෙසැම්බර් 15 වන දින නිම කර තිබුණද, 2021 දෙසැම්බර් මාසය සඳහා වන ප්‍රගති වාර්තාවට අනුව භෞතික ප්‍රගතියෙන් සියයට 96.4 ක් පමණක් ලබාගෙන ඇති බව එහි සඳහන් වේ. තවද, කොන්ත්‍රාත්තුවේ සාමාන්‍ය කොන්දේසිවල 10.1 උප වගන්තියට පටහැනිව, පාලම භාර දෙන අවස්ථාවේ සියලුම මතුපිට වැඩ, ඉන්ටර්ලොක් සහ ඇතිරීමේ වැඩ, පාලම් පදික තීරුවල ස්ලැබ් තැබීම, වීදි ආලෝකකරණය වැනි ප්‍රධාන කාර්යයන් සම්පූර්ණ කර නොතිබුණි. කෙසේ වෙතත්, ඉතිරි වැඩ නිම කිරීම සඳහා වැඩසටහනක් විගණනය සඳහා ලබා දී නොතිබුණි. | ගැටලු නොවිසඳීම හේතුවෙන් කාලය දීර්ඝ කිරීමට අදාළ පිරිවැයන් අවම කිරීම සඳහා ව්‍යාපෘති අධ්‍යක්ෂවරයා විසින් පාලම පවරා ගැනීමට තීරණය කරන ලදී. | කිරීමට පෙර සියලුම උපයෝගිතා කටයුතු නිරාකරණය කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (iii) | ඔරුගොඩවත්ත - අඹතලේ මාර්ගයේ පාලම් අංක 4/3 පුළුල් කිරීමේ කටයුතු 2019 සැප්තැම්බර් 07 දින ආරම්භ කර 2020 දෙසැම්බර් 07 දින නිම කිරීමට නියමිතව තිබුණි. පවරා ගැනීමේ සහතිකයට අනුව පාලම 2021 ඔක්තෝම්බර් 26 වන දින නිම කර තිබුණද, 2021 දෙසැම්බර් මාසය සඳහා වන ප්‍රගති වාර්තාවට අනුව භෞතික ප්‍රගතියෙන් සියයට 99.8 ක් පමණක් ලබාගෙන ඇති බව එහි සඳහන් වේ.තවද, කොන්ත්‍රාත්තුවේ සාමාන්‍ය කොන්දේසිවල 10.1 උප වගන්තියට පටහැනිව, පාලම භාර දෙන අවස්ථාවේ සියලුම පින්තාරු කිරීමේ කටයුතු, Gabion බිත්ති ඉදිකිරීම, පිරිසිදු කිරීම සහනිමැදීමේ කටයුතු, පාලමේ පිටුපස බිත්තිය නිවැරදි කිරීම සහ ඇතිරීමේ වැඩ වැනි ප්‍රධාන කාර්යයන් සම්පූර්ණ කර නොතිබුණි. කෙසේ වෙතත්, ඉතිරි වැඩ නිම කිරීම සඳහා වැඩසටහනක් විගණනය සඳහා ලබා දී නොතිබුණි. | එකඟ වේ. ජල සම්පාදන මණ්ඩලයේ නව නල එලීම අවසන් වන තුරු ප්‍රධාන වැඩකටයුතු වලට සහභාගි විය නොහැක. | මාර්ග/පාලම් ප්‍රතිසංස්කරණ කටයුතු ආරම්භ කිරීමට පෙර සියලුම උපයෝගිතා කටයුතු නිරාකරණය කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය |

## 3.2 කොන්ත්‍රාත් පරිපාලනය

| අංකය | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | කොන්ත්‍රාත්තුවේ සාමාන්‍ය කොන්දේසි 4.2 උප වගන්තිය යටතේ දක්වා ඇති උපදෙස් වලට පටහැනිව, කොන්ත්‍රාත්කරුවන්ට කාර්ය සාධන ඇපකරය සැපයීමේ පිරිවැය අයකර ගැනීමට හැකිවන අයුරින් මාර්ග ප්‍රතිසංස්කරණ ප්‍රමාණ පත්‍රවල වෙනම ගෙවීම් අයිතමයක් ඇතුලත් කර තිබුණි. ඒ අනුව කොන්ත්‍රාත්කරුවන් 4 ක් විසින් ලබාගත් කාර්ය සාධන ඇපකරවල පිරිවැය ප්‍රතිපූරණය කිරීම සඳහා රු. මිලියන 2.79 ක අතිරේක මුදලක් කොන්ත්‍රාත්කරුවන්ට ගෙවා තිබුණි. | ඉහත සංකල්පය පිටුපස ඇති හේතුව නම්, කොන්ත්‍රාත්කරුට කාර්ය සාධන බැඳුම්කරවල පිරිවැය වෙනම ඉල්ලා සිටීමට ඉඩ නොදෙන්නේ නම්, ඔහුට ගාස්තුවලට ඇතුළත් කිරීමට අවස්ථාවක් තිබෙන අතර එමගින් ගාස්තු අසාමාන්‍ය ලෙස ඉහළ යාම සහ කොන්ත්‍රාත්තුවේ මුළු පිරිවැය වැඩිවීම සිදු වේ. | ලංසු ලේඛන නිකුත් කිරීමට පෙර ප්‍රසම්පාදන විශේෂඥ සහ තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් ප්‍රමාණ පත්‍ර සමාලෝචනය කළ යුතුය. |
| (ආ) | ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය 2012 වර්ෂයේදී ආරම්භ කළද, එම ක්‍රියාවලිය තවමත් සිදු වෙමින් පවතී. 2021 දෙසැම්බර් 31 දිනට ඉඩම් කට්ටි 238 ක් සඳහා වන්දි වශයෙන් රු.මිලියන 153.7 ක් සහ ඉඩම් කට්ටි 82 ක් සඳහා ප්‍රමාද පොලිය ලෙස රු. මිලියන 15.05 ක් ගෙවා ඇති බව නිරීක්ෂණය විය. තවද, ව්‍යාපෘතිය විසින් 2021දෙසැම්බර් 31 දින වනවිට පවා ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ 44 උප වගන්තිය අනුව මාර්ග සංවර්ධන අධිකාරිය යටතේ ඉඩම් කැබලි කිසිවක් ලියාපදිංචි කර නොතිබුණි. | එකඟ වේ. | වන්දි මුදල් ගෙවීමට කඩිනම් ක්‍රියාමාර්ග ගත යුතු අතර ඒ සඳහා වන අමතර වියදම් වළක්වා ගැනීමට සහ ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය කඩිනම් කිරීමට කටයුතු කළ යුතුය. |